ථෙරවාදී ත්‍රිපිටක සංරක්ෂණ පනතක් අවශ්‍ය ඇයි?

ථෙරවාද ත්‍රිපිටක සංරක්ෂණ පනත කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු දැනට නීති කෙටුම්පත් අංශයේ කෙටුම්පත් වෙමින් පවතී. යෝජිත මෙම පනත සම්බන්ධයෙන් සමාජය තුළ පක්ෂව හා විපක්ෂව විවිධ ආකාරයේ කතාබහ සිදු වෙමින් පවතින බව පෙනේ. මේ ඒ පිළිබඳ විමසුමකි.

මෑත කාලයේ ත්‍රිපිටක සංරක්ෂණ පනතක අවශ්‍යතාව පිළිබඳ සමාජ සංවාදය ඇති වන භූමිකාව පිළිබඳ මුලදීම විමසීම වැදගත් වේ. වසර කිහිපයක පටන් ත්‍රිපිටක ධර්මය හා බෞද්ධ ඉතිහාසය විකෘති කරමින් ශාසන විලෝපකාරී කටයුතු සිදු කරන සංවිධාන හා පුද්ගලයන් පිළිබඳ ගිහිපැවිදි සමාජයේ දැඩි කතාබහකට ලක් විය. එසේම බුදුදහමට නිගරු වන පරිදි විවිධ ක්‍රියාකාරකම් සිදු කෙරෙන ආකාරයක් ද දක්නට ලැබිණි. මෙවන් පසුබිමක් තුළ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති විසින් ත්‍රිපිටකය ආරක්ෂා කරගැනීමේ පියවරක් වශයෙන් ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත් කොට ප්‍රකාශ කරන ලදී. එසේම නායක මාහිමිපාණන් ඇතුළු ධර්මවිනයධර මහාසංඝරත්නයෙන් සමන්විත ත්‍රිපිටක සංරක්ෂණ මණ්ඩලයක් ද පත් කෙරිණි. මෙම මණ්ඩලය විසින් සිය අවධානය යොමු කරන ලද ප්‍රධානතම කරුණු අතර, අනාගත පරපුර වෙනුවෙන් ත්‍රිපිටකය, අට්ඨකථා හා ටීකා ආරක්ෂා කොට තැබීම සඳහා නෛතික රැකවරණය සැලසීමට කටයුතු සංවිධානය කිරීමේ යෝජනාව විය. ඒ වනවිට ගැසට් පත්‍රයක් මගින් ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත් කොට තිබුණ ද ඉන් සැලසෙන ආරක්ෂාව ප්‍රමාණවත් නොවන බව පෙනී ගිය බැවින් විධිමත් සුරක්ෂිතතාවක් සැලසීම සඳහා ත්‍රිපිටක සංරක්ෂණ පනතක් සකස් කළ යුතු බවට යෝජනා විය. ත්‍රිපිටක සංරක්ෂණ පනත සකස් කිරීම ආරම්භ වන්නේ මෙවන් පසුබිමකදීය.

යථෝක්ත පනත පිළිබඳ විමතිය උපදවන ඇතැමුන් විසින් මෙය ධර්මදේශකයන් වහන්සේලා සිරගත කරමින් පීඩාවට පත් කළ හැකි පනතක් වශයෙන් ද බුදුදහමේ පවතින චින්තන නිදහසට බාධා ඇති කරන්නක් වශයෙන් ද පවසනු පෙනේ. එසේම මෙම පනත මගින් පත් කෙරෙන කිසියම් මණ්ඩලයකට සිය අභිමතය පරිදි ධර්මවිනය පිළිබඳ තීරණය කිරීමට හැකි වන ආකාරයට ත්‍රිපිටකය පවරාදීමක් වැනි දෙයක් සිදු කෙරෙන බවට ද එම මණ්ඩලය විසින් ධර්මවිනය පිළිබඳ කවර දෙයක් පැවසුව ද ඒවා සියල්ලන් විසින් ම පිළිගත යුතු වන බවට ද දුර්මත පතුරුවනු දක්නට ලැබේ. මෙවැනි ප්‍රකාශනවල ව්‍යාජ බව තේරුම් ගැනීම සඳහා යථෝක්ත පනතේ අන්තර්ගතය විමසීම වැදගත් වේ.

මෙම පනතෙහි හැඳින්වීම පිළිබඳ කොටසෙහි ''ත්‍රිපිටකය, පාලි අට්ඨකථා හා පාලි ටීකා වෙනස් කිරීම, විකෘති කිරීම, විරූප කිරීම, විනාශ කිරීම, නිග්‍රහ කිරීම, අවමන් කිරීම, අයථා භාවිතය, සාවද්‍ය ලෙස අර්ථ නිරූපණය කිරීම වැළැක්වීම සඳහා ත්‍රිපිටක සංරක්ෂණ මණ්ඩලය පිහිටුවන බව" පැහැදිලිව දක්නට හැකි ය. ත්‍රිපිටක මූලාශ්‍ර වෙනස් කිරීමට නොදී ආරක්ෂා කොට තැබීම බුදුසසුනේ ආරක්ෂාව සඳහා ගත හැකි උසස් ම පියවරක් වන අතර, අතීතයෙහි සිට ධර්ම සංගායනාවලින් පවා සිදුකරන ලද්දේ නිර්මල බුද්ධභාෂිතය ඒ ආකාරයෙන් ම ආරක්ෂා කොට තැබීමයි. ධර්මධර විනයධර මහයතිවරු සහ සැදැහැවත් බොදුනුවන් යුද කෝලාහල, දුර්භික්ෂ ආදී සියලු බාධක මැද ත්‍රිපිටකය රැක ගැනීම සඳහා අපරිමාණ කැපකිරීම් සිදු කළ බව ඉතිහාසය පිරික්සීමෙන් දත හැකිය. එබැවින් ත්‍රිපිටකය, පාලි අට්ඨකථා හා පාලි ටීකා ආරක්ෂා කර ගැනීම සඳහා නෛතික රැකවරණයක් සැපයීම සඳහා මෙම පනත සකස් කොට සම්මත කිරීම වර්තමානයේ බුදුසසුන වෙනුවෙන් සිදු කරනු ලබන විශිෂ්ටතම කාර්යභාරයක් වශයෙන් දැක්විය යුතුය. ලෝකයේ කවර රාජ්‍යයක් වුවද තමන් සතු වටිනාම සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ අනපනත් සම්මත කරගනු ලබන්නේ ඒවා ආරක්ෂා කොට අනාගතයට උරුම කරදීම සඳහාය. එසේ ඇති කළ මේ දක්වා අපගේ උතුම් ම සම්පතක් වන ත්‍රිපිටකය ආරක්ෂා කිරීම සඳහා අනපනත් සම්මත කර නොතිබීමේ අඩුව දැන්වත් පිරිමසා ගැනීමට කාලය එළඹ ඇත.

මෙම පනත පිළිබඳ ප්‍රකාශන සිදු කරන ඇතැමුන් විසින් ධර්ම දේශකයන් වහන්සේලා දහම් දෙසන විට අක්ෂරයක් වැරදුණත් ඒ සඳහා දඬුවම් ලෙස සිරගත කිරීමට ලක් කෙරෙන බවට ව්‍යාජ කරුණු පවසමින් ජනතාව මුළා කළද මෙම පනතෙහි ත්‍රිපිටකය විකෘති කිරීමට නොදී ආරක්ෂා කිරීම යනුවෙන් අදහස් වන්නේ එවැනි බොළඳ ක්‍රියාවලියක් නොවන බව පැවසිය යුතුය. සැබවින්ම මෙහිදී සිදු වන්නේ යම් කිසිවකු ත්‍රිපිටකය විකෘති කළ බවට හෝ ත්‍රිපිටකයට නිග්‍රහ කළ බවට පැමිණිල්ලක් ලැබුණු පසු මණ්ඩලය විසින් එම කරුණු පිළිබඳ අපක්ෂපාතී විමර්ශනයක් සිදු කරනු ලැබීමය.

එහිදී අදළ චූදිත පාර්ශ්වය සමග සාකච්ඡා කිරීම, එම පාර්ශ්වයට කරුණු දැක්වීමට අවස්ථාව ලබාදීම, නොදැනුවත්කමින් හෝ චේතනාත්මකව සිදු කරන ලද දැයි විමර්ශනය කිරීම, ධර්ම විකෘති කළ බවට නැගෙන චෝදනාවන්ට අදළ කරුණු ත්‍රිපිටකය ප්‍රමුඛ කොට අට්ඨකථා හා ටීකාවන්ට අනුගත දැයි විමර්ශනය කිරීම හා අදළ තොරතුරු චූදිත පාර්ශ්වයට දැනුම් දීම, වරදක් වී ඇත්නම් ඒවා නිවැරැදි කරගැනීමට අවස්ථාව ලබාදීම ආදී කාර්යාවලියක් එම මණ්ඩලය මගින් සිදු කෙරේ. යම් තැනැත්තකු චේතනාත්මකව වරදක් කොට ඇත්තේ නමුත් ඔහු විසින් වරද පිළිගෙන මතු සංවරය සඳහා එළඹෙන්නේ නම් එවැන්නන් කෙරෙහි පවා සමාව දීමට මණ්ඩලයට හැකිය. කෙසේ වුව ද යම් කිසිවකු චේතනාත්මකව ත්‍රිපිටකය විකෘති කරමින් හෝ ඊට අපහාස කරමින් කටයුතු කරන්නේ නම් ඔහු වරද නිවැරැදි කරගැනීම සඳහා ද නොඑළඹෙන්නේ නම් එවැන්නන් කෙරෙහි පනතෙහි බලප්‍රකාරව කටයුතු සිදු කෙරෙයි. මෙහි දී මණ්ඩලයේ භික්ෂූන් වහන්සේලා එකී විමර්ශනය පිළිබඳ වාර්තාවක් මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලබා දීමෙන් අනතුරුව නඩු පැවරීම සිදු කරන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නීතිපති මගිනි.

බුදුසසුන වංචනික හා ශාසන විලෝපකාරීන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා මෙතෙක් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇත්තේ මේ දක්වා අදළ නීති ප්‍රතිපාදන සම්පාදනය වී නොමැති බැවින් බව බොහෝදෙනා නොදනිති. ශාසනික අර්බුද ඇති කරන පුද්ගලයන් පිළිබඳ නිසි ක්‍රියා මාර්ග නොගැනීම පිළිබඳ ඇතැම් විට මහානාහිමිවරුන් වෙත චෝදනා එල්ල කළ ද පවතින සැබෑ ගැටලුව වන්නේ ඒ සඳහා අදළ අණපනත් මෙතෙක් නිසි පරිදි සම්මත කොට ගෙන නොතිබීමය. බුදුසසුන ආරක්ෂා කර ගැනීම සඳහා අදළ ක්‍රියා මාර්ග සලසන ලෙස පැවති සෑම රජයකට ම මහානාහිමිපාණන් වහන්සේලා පවා ප්‍රකාශ කරන ලද අවස්ථා බොහෝ තිබුණ ද මේ දක්වා ද එවැනි නෛතික රක්ෂාවරණයක් සැලසුණු අවස්ථා නොමැති තරම්ය. එබැවින් ත්‍රිපිටක ධර්මය ආරක්ෂා කර ගැනීම සඳහා ඉදිරිපත් වන මෙම පනත සම්මත කර ගැනීම ගිහිපැවිදි සමස්තයටම මහත් අස්වැසිල්ලක් වනු නිරනුමානය.

කෙසේ වුවද බුදුසසුන වැනසීමට සංවිධානාත්මකව ක්‍රියා කරන අයට සහ ඔවුන්ගේ අදිසි හස්තයන්ට නම් මෙම පනත මහත් හිසරදයක් වී ඇති බව සමාජ මාධ්‍ය තුළින් පෙනේ. එබැවින් ධර්ම දේශනයක දී පදයක් වැරදුණ ද උන්වහන්සේලාට මෙම පනත නිසා සිරගත වීමට සිදු වන බව පවසා බොරු බිල්ලන් මවා පෑම ජනතාව මුළා කිරීම සඳහා සිදු කරන වෑයමක් බව කිව යුතු ය. කිසියම් පනතක් සකස් කිරීමේ දී එයින් ස්ථාපිත වන ආයතනයෙහි සියලු කාර්යභාරය පනතට ඇතුළත් නොකරන අතර, ඒවා පනත් සම්මත වීමෙන් පසු රීති මගින් සම්පාදනය කිරීම සාමාන්‍ය ක්‍රමවේදය බව අණපනත් ගැන අවබෝධයක් ඇති අය දනිති.

මෙම ත්‍රිපිටක සංරක්ෂණ පනත සම්මත වීමට තබා කෙටුම්පත් කොට නිමා වීමටත් පෙර එහි කාර්යභාරය පිළිබඳ කිසිදු දැනුමක් නැති අය විසින් ජනතාව නොමග යැවීම සඳහා ව්‍යාජ තොරතුරු සමාජගත කිරීම තුළින් පැහැදිලි වන්නේ ස්වකීය යටි අරමුණු වෙනුවෙන් කටයුතු කරන බවක් මිස අනෙකක් නොවේ.

යථෝක්ත පනත මගින් බුදුදහමෙහි ලබා දී ඇති චින්තන නිදහසට බාධා වන බවට ද ඇතැමුන් ව්‍යාජ තොරතුරු පවසන බව පෙනේ. මානව ඉතිහාසය තුළ බුදුදහම තරම් සිතීමේ නිදහස හා වීමංසන බුද්ධිය සඳහා අවස්ථාව ලබා දෙන වෙනත් කිසිදු ආගමක් පහළවී නොමැත. කාලාම සූත්‍රය වැනි දේශනා තුළින් ප්‍රකට වන්නේ නිදහස් චින්තනය පිළිබඳ බුද්ධ මතයයි. සාමාන්‍ය ලෝකය තුළ ස්වාභිමතය අනුව ආගම් ඇදහීම සම්බන්ධයෙන් සහතශීලී පිළිවෙතක් අනුගමනය කළ උන්වහන්සේ නුවනින් විමසා බලා කටයුතු කිරීම නිරන්තරයෙන් අගය කළහ. බුදුසමය තුළ ඇති මෙම නිදහස් චින්තනයට ගරු කිරීමේ උදර ලක්ෂණය ඇතැමුන් අපයෝජනයට ලක් කරන බව දක්නට හැකිය.

සිතීමේ නිදහස පිළිබඳ සඳහන් සූත්‍රපාඨ උඳුරා දක්වමින් බුදුරදුන් වදළ ධර්මය පවා නොපිළිගත යුතු බව බුදුරදුන් විසින්ම වදරා ඇතැයි ද ඇතමෙකු විසින් පවසනු දක්නට ලැබේ. කෙසේ වුවද බුදුදහම නොපිළිගන්නා ලෙස ප්‍රකාශ කිරීමක් කාලාම සූත්‍රයෙහි හෝ වෙනත් තැනක ද සඳහන් නොවන අතර කාලාම සූත්‍රයෙහි විමසීම යන්නෙන් අදහස් වී ඇත්තේ කුසල අකුසල යන නිර්ණායක මත සිදු කෙරෙන වීමංසනයක් විනා කුමන ආකාරයේ හෝ විමසීමක් නොවේ.

තවද බුදුසමයෙහි චින්තන නිදහස අගය කොට ඇත්තේ බුදුදහමෙහි ඇති අක්ෂර, පද පවා විකෘති කිරීම සඳහා නොවන බව කිව යුතුය. එවැනි අඳබාල නිදහසක් බුදුසසුන තුළ නොමැති බව ඉඳුරාම කිව යුතුය. එබැවින් මෙම පනත මගින් සිදු කෙරෙන්නේ චින්තන නිදහස අනුරාලීම නොව එවැනි චින්තන නිදහසක් ලබා දී ඇති උතුම් ධර්මය අනාගත පරපුරටත් උරුම වන පරිදි ආරක්ෂා කොට තැබීමය.

තවත් අයෙක් බුදුදහම තම තමන්ට වැටහෙන ආකාරයෙන් ගෙන විවරණය කිරීමට අවස්ථාව තිබිය යුතු බව ද පවසති. "පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි, තම තම නැණ පමණින් දැනගත යුතු" වැනි වදන් දක්වමින් මේ අදහස සනාථ කිරීමට උත්සුක වන බව පෙනේ. මෙහි දී ඒ සඳහා පැවසිය යුත්තේ බුදුරජාණන් වහන්සේ විසින් තම තමන්ට වැටහෙන කවර හෝ ආකාරයකින් බුදුදහම අර්ථකථනය කිරීමට ඉඩක් ලබා දී ඇතැයි සැලකීම ද මුළුමනින් ම සාවද්‍යබවයි. මජ්ඣිම නිකායේ මහාතණ්හාසංඛය සූත්‍රයේ දී සාති භික්ෂුව විසින් ධර්මය වරදවා ගත් අවස්ථාවේ දී බුදුරදුන් සාති භික්ෂුවට මොඝපුරිස (හිස් පුරුෂය) වාදයෙන් නිග්‍රහ කොට සාති භික්ෂුව ධර්මය වරදවා ගැනීමෙන් බොහෝ අකුසල් සිදු කරගන්නා බවත් බුදුසසුනට දෙස් පවරණ බවත් වදළහ. එබැවින් තම තමන්ට වැටහෙන සියලු දේ ම බුදුවදන් වශයෙන් ප්‍රකාශ කිරීම හිස් පුරුෂයන්ගේ කාර්යයක් මිස බුදුරදුන් අනුදැන වදළ දෙයක් නොවන බව දත යුතුය. එබඳු අඥනවාද බුදුදහම වශයෙන් දැක්වීමට ඉඩ සැලසීමක් බුදුරජාණන් වහන්සේ විසින් ලබා දී නොමැති අතර, එය බෞද්ධ විනයානුකූලව ද වරදක් බව දැක්වා ඇත.

ඇතැමුන් ත්‍රිපිටකයේ දැක්වෙන තත්ථ අපරිමාණා පද අපරිමාණා අක්ඛරා අපරිමාණා ඛඤ්ජනා අපරිමාණා ආකාරා නෙරුත්තා නිද්දේසා වැනි සූත්‍රපාඨයන් දක්වමින් ධර්මය විග්‍රහ කිරීමට ඕනෑ තරම් අක්ෂර, පද හා නිරුක්ති භාවිත කිරීමට බුදුදහම තුළ ඉඩ දී ඇති බවත් ත්‍රිපිටක පනත මගින් එම අවස්ථාව ඇහිරී යන බවත් පවසනු පෙනේ. මෙවැනි උදාත දක්වමින් උත්සාහ කරන්නේ මේ කාලයේ ඇතැමුන් විසින් ත්‍රිපිටකයට සපයන විකාරරූපී අර්ථකථන සාධාරණීකරණය කිරීමටත් එවැනි දෑ දිගින් දිගටම සිදු කරගෙන යාමටත් අවස්ථාව සලසා ගැනීමටය.

මෙකල ඇතැම් ධර්ම විකෘතිකයන් විසින් බුදුදහම විග්‍රහ කිරීමට අප්‍රමාණ අක්ෂර, පද ඇති බව පවසමින් සූවිසි ගුණ ප්‍රකාශ වන තැන්වල ඇති "ලෝකවිදූ" යන පදයට"තුන් ලෝකයට ම විද්ද නිසා ලෝකවිදූ" නම් වන්නේ යැයි ද "සාමීචිපටිපන්න" යන පදයට "සතුටු සාමීචියට හරි ගෝක් නිසා සාමීචිපටිපන්න" නම් වන්නේ යැයි ද ආදී වශයෙන් මුග්ධ, හිස් ප්‍රකාශ සිදුකිරීම තුළින් බුදුරජාණන් වහන්සේට හා සඟගුණයන්ට සිදු කරන අපහාසය කෙතරම් ද? මේ ආකාරයෙන් සෑම බුදුවදනකටම විකාරරූපී අර්ථකථන සැපයීම තුළින් අනාගතයෙහි නිර්මල බුදුදහම වෙනුවට හිස් මිනිසුන්ගේ ප්‍රලාප ඉස්මතු වීම මගින් ශාසනය විනාශ වන බව කවරෙකුට නම් තේරුම් ගත නොහැකි ද?

ඉහත දක්වා ඇති තත්ථ අපරිමාණා පද... ආදී බුදුවදන් මගින් ප්‍රකාශිත ව ඇත්තේ චතුරාර්ය සත්‍යයෙහි ඇතුළත් දහම් කරුණු ප්‍රකාශ කිරීම සඳහා බොහෝ වචන භාවිත කළ හැකි බව මිස විකෘති අර්ථකථන සැපයීමට හැකි බව නොවේ. නිදසුනක් වශයෙන් දුක පිළිබඳ විවිධ වචනවලින් පැවසිය හැකිය. එසේ වුවත් දුක යන පදයට බුදුරදුන් වදළ අර්ථය වෙනස් කොට වෙනත් විකාරරූපී අර්ථයක් දීමට යථෝක්ත සූත්‍රපාඨයෙන් අවස්ථාව ලබා දී නැත. පහත දැක්වෙන්නේ ත්‍රිපිටක ධර්මයේ පද වරදවා ගැනීම හේතුවෙන් සද්ධර්මය අන්තර්ධාන වන්නේ යැයි බුදුරදුන් වදළ සූත්‍රයක කොටසකි.

ඉධ භික්ඛවෙ භික්ඛු දුගගහීතං සුත්තන්තං පරියාපුණන්ති දුන්නික්ඛිත්තස පදබ්‍යඤ්ජනෙහි. දුන්නික්ඛිත්තසස භික්ඛවෙ පදබ්‍යඤ්ජනසස අත්ථෝපි දුන්නයො හොති. අයං භික්ඛවෙ පඨමො ධම්මෝ සද්ධම්මසස සම්මොසාය අන්තරධානාය සංවත්තති.

මහණෙනි, මෙ සස්නෙහි මහණහු වරදවා ගත් සූත්‍රාන්ත වරදවා ලූ පදව්‍යඤ්ජනයෙන් ප්‍රගුණ කරත්. මහණෙනි, වරදවා ලූ පදව්‍යඤ්ජනයාගේ අර්ථය ද දුර්නය වෙයි. මහණෙනි, මේ පළමුවන දහම ශාසනයේවිනාශය පිණිස අන්තර්ධානය පිණිස වැටෙයි.

මෙයින් ප්‍රකාශ වී ඇත්තේ බුදුන් වදළ ධර්මයෙහි අක්ෂර, පද ආදිය වරදවා ගැනීම සද්ධර්මය අන්තර්ධාන වීමට හේතු වන බවයි. එබැවින් බුදුදහම ලෝකයෙහි බොහෝ කාලයක් පවත්වා ගෙනයාම සඳහා එහි අක්ෂරයක් පවා වෙනස් නොකොට ආරක්ෂා කිරීම ඉතා වැදගත් කරුණක් බව තේරුම් ගත හැකිය. එය ඉහත බුදුවදනින්ම වඩාත් පැහැදිලි වේ. මෙම පණත මගින් ත්‍රිපිටකයෙහි ඇති අක්ෂරයකට පවා ආරක්ෂාව සපයනුයේ කවර හේතුවක් නිසා දැයි දැන් ඔබට වටහා ගත හැකිය.

මේ පිළිබඳ තවදුරටත් කිව යුතු වන්නේ මෙම පනත මගින් භාෂණයේ නිදහස උල්ලංඝණය වීමක් කිසි අයුරෙකින් සිදු නොවන බවයි. කතා කිරීමේ නිදහස ඇත්තේ අනෙකෙකුට රිදවීමට හෝ පීඩාවට පත් කිරීමට නොවේ. භාෂණයේ නිදහසේ නාමයෙන් බෞද්ධයන්ගේ සිත් පැරීම, සමාජය තුළ අර්බුද ඇති කිරීම, ආගම්වලට නිග්‍රහ කරමින් හෝ විකෘති කරමින් ජනතාව අතර සංඝිඳියාව විනාශ කිරීමට අවස්ථාව සැලසීම සමස්ත සමාජයට ම අන්තරායකර වූවකි.

මෙම පනත මගින් සිදු කෙරෙන්නේ ත්‍රිපිටකය, අට්ඨකථා හා ටීකා යන බෞද්ධ මූලාශ්‍රය විකෘති කිරීම් වැළක්වීම ය. ඉපැරැණි කවර හෝ මූලාශ්‍රයක් විකෘති නොකොට ආරක්ෂා කිරීම සමස්ත සමාජයේ ම වගකීමකි.

රාජකීය පණ්ඩිත
මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි

මෙම පනත මගින් පත් කෙරෙන මණ්ඩලය බුදුදහම පිළිබඳ ප්‍රකාශ කරන ධර්ම විරෝධී දෙයක් වුව ද බෞද්ධයන්ට පිළිගන්නට සිදු වන්නේ යැයි තවත් මතයක් සමාජගත කරමින් පවතින බව පෙනේ. මෙය මුළුමනින්ම සාවද්‍ය ප්‍රකාශයක් බව මුලදීම කිව යුතුය. එවැනි මුග්ධ ක්‍රියාවලියකට කිසිදු අවසරයක් මෙම පනතෙහි අන්තර්ගත නොවේ."මණ්ඩලය විසින් ධර්මය පිළිබඳ සපයන නිර්දේශ අවසානාත්මක නිර්දේශ වශයෙන් පිළිගත යුතු" බවට පනතෙහි දැක්වෙන වගන්තිය ගෙනහැර දක්වමින් මෙවැනි දුර්මත පතුරුවා හරින බව පෙනේ. සම්පූර්ණ පනත පිළිබඳ විග්‍රහ නොකොට පනතෙහි කිසියම් කොටසක් පමණක් දක්වමින් මෙවැනි අසත්‍ය ප්‍රචාර සිදු කරනු දක්නට හැකිය.

පනත තුළ මණ්ඩලයේ නිර්දේශ පිළිබඳ සඳහන් වන අවස්ථාවේ දී ත්‍රිපිටකය, අට්ඨකථා හා ටීකාවලට අදළ කිසියම් කරුණක් සම්බන්ධයෙන් මතභේදයක් ඇති අවස්ථාවක ථෙරවාද අර්ථකථන සම්ප්‍රදය හා පාලි ව්‍යාකරණ සම්ප්‍රදය සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන නිර්දේශ අවසානාත්මක යැ"යි අදහස් වන වගන්තිය ද "පනත යටතේ සිදු වන යම් නඩු කටයුත්තක දී මණ්ඩලයේ නිර්දේශය නිවැරැදිබවට පූර්ව නිගමනය කළ යතු බව හා මතභේදයට විෂය වන කාරණාව පිළිබඳව තීරණාත්මක සාක්ෂි වශයෙන් පිළිගත යුතු වන බව" සඳහන් වගන්තිය ද දැක්විය හැකි ය. මෙයින් ප්‍රකාශ වන්නේ ඉහත දී දක්වන ලද පරිදි යම්කිසි තැනැත්තෙක් චේතනාත්මකව ම ධර්මය විකෘති කරමින් පවතී නම්, ඔහු තම වරද නිවැරැදි කර ගැනීමට ද සූදනම් නැත්නම්, එවැනි පුද්ගලයන්ට එරෙහිව නඩුපැවරීමක් සිදු කළ අවස්ථාවක දී එකී ධර්ම විකෘතීන් පිළිබඳව හා අදළ කරුණු ත්‍රිපිටකයෙහි නිවැරදිව සඳහන් වී ඇති ආකාරය පිළිබඳ මණ්ඩලය විසින් වාර්තාවක් සපයනු ලබයි. ''මෙම මණ්ඩලයෙහි නිර්දේශය අවසානාත්මක බවත් නඩු කටයුත්තක දී එය නිවැරදි බවට පූර්ව නිගමණය කළ යුතු බව හා තීරණාත්මක සාක්ෂි වශයෙන් ගත යුතු" බව පනතෙහි වගන්තිවලට ඇතුළත් කොට තිබෙන්නේ යථෝක්ත වාර්තාවට අදළ නෛතික බලය ලබාදීම සඳහාය. මෙවැනි වගන්තියක් අවශ්‍ය වන්නේ නඩුව විසඳන විනිසුරුවරුන් ත්‍රිපිටකය හා පාලි භාෂාව පිළිබඳ ප්‍රවීණයන් නොවිය හැකි බැවින් අදළ තීන්දුවලට එළඹීම සඳහා ත්‍රිපිටකය හා පාලි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ඇති නෛතික බලයක් සහිත විශේෂඥ කමිටුවක නිර්දේශයක් තිබීම වැදගත් වන බැවින්ය. එසේම මෙය ශාසනික කටයුත්තක් බැවින් වගකිව යුතු භික්ෂූන් වහන්සේලාගේ නිර්දේශය ලබාගැනීම ඉතා වැදගත් වන බැවින්ය. ඒ හැර මෙයින් දැක්වෙන්නේ මණ්ඩලය විසින් ප්‍රකාශ කරන අධාර්මික දෙයක් වුවත් සියල්ලන්ම පිළිගත යුතු බව හෝ මණ්ඩලයේ නිර්දේශයන්ට පිටින් කිසිවෙකුට ධර්මය හැදෑරිය නොහැකි බවක් හෝ නොවේ. මෙසේ තිබිය දී අයෙක් පනතෙහි මෙවැනි වගන්ති යෙදී ඇති අරමුණු හා ඒවා භාවිත වන අවස්ථා පිළිබඳ කිසිදු වගවිභාගයකින් තොරව වගන්තිවල ඇති වචන කිහිපයක් දක්වා පනත පිළිබඳ විපරීත අදහස් දක්වමින් ජනතාව මුළා කරනු දක්නට හැකිය. කෙසේ වුව ද ඔවුන් එසේ කිරීමේ යටි අරමුණු කුමක් දැයි තේරුම් ගැනීම කාහට වුවත් අපහසු දෙයක් නොවේ.

ත්‍රිපිටකය ආරක්ෂා කිරීම සඳහා නීති පැනවීමක් අවශ්‍ය නොවන බව පවසමින් මේ පිළිබඳ ඇති ජනතා උද්යෝගය නැති කිරීම සඳහාද ඇතමුන් ප්‍රකාශ සිදු කරන බව පෙනේ. ඔවුනට අතීතයේ පටන් බුදුදහම ආරක්ෂා කර ගැනීම සඳහා රාජ්‍ය මැදිහත් වීම සිදුවී ඇති බව අමතක වී ඇතියි අපට නොසිතේ. ප්‍රථම ධර්ම සංගායනාවෙහි දී අජාසත්ත රජු ප්‍රකාශ කළේ ඔබ වහන්සේලාගේ ධර්ම චක්‍රය වේවා! මාගේ ආඥ චක්‍රය වේවා! යනුවෙනි. ඒ අනුව ධර්මය ආරක්ෂා කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය හා ආරක්ෂාව කෙතරම් වැදගත් දැයි තේරුම් ගත හැකි ය.

තෙවන ධර්ම සංගායනා කාලයෙහි ශාසනයට පිවිස සිටි චීවරධාරීන් සැටදහසක් නෙරපා හැර බුදුසසුන තුළ අර්බුද හට නොගන්නා බවට පත් කරන ලද්දේ ධර්මාශෝක මහරජුගේ මැදිහත් වීමෙනි. ලක්දිව වෝහාරිකතිස්ස රජු එකල බුදුසසුන වනසන වෛතුල්‍යවාදය ගත් පාපී භික්ෂූන් වෙරළකුණු ඔබ්බවා (හන ගසා) සසුනෙන් නෙරපූ බව කියැවේ.

රාජ්‍ය ආරක්ෂාව සලසා බුදුසසුන රැකගත් අවස්ථා ඉතිහාසය තුළ කොතෙකුත් දක්නට හැකිය. වර්තමානයෙහි ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පවතින බැවින් බුදුදහමට රාජ්‍ය ආරක්ෂාව ලබාදීමට ඇති හොඳම විධිය වන්නේ ඊට අදළ අණපනත් සම්මත කොට ක්‍රියාවට නැංවීමයි. රාජ්‍ය අනුග්‍රහය නැති වී ගිය කාලයන්හි දී බුදුසසුන පරිහානියට පත් වී ඇති ආකාරය හා අනුග්‍රහය පැවති යුගයන්හි සසුන දියුණු වූ ආකාරය ඉතිහාසය තුළ මැනවින් පැහැදිලිය. බුදුසසුන විනාශ කිරීමේ ව්‍යාපාරවල යෙදෙන්නන් හා එම විනාශය දකිනු රිසිව නෙත් දල්වා සිටින්නන් විසින් බුදුදහමට රාජ්‍ය ආරක්ෂාව නොලැබීයාම පිළිබඳ දක්වන්නේ අසීමිත කැමැත්තකි. එබැවින් මෙවනි පනත් ඔස්සේ රාජ්‍ය ආරක්ෂාව මගින් බුදුසසුනේ ආරක්ෂාව තහවුරු වනු දැක්ම එවැන්නන්ට නම් ඇස්වල කටු ඇනීමක් බඳු බව දක්නට හැකිය.

මෙම පනත මගින් පත්වන ත්‍රිපිටක සංරක්ෂණ මණ්ඩලය පිළිබඳව ද ඇතමුන් විවිධ මත ගොඩ නගමින් පවතින බව දක්නට ලැබේ. එබැවින් ඒ පිළිබඳව ද කෙටියෙන් හෝ හැඳින්වීමක් කළ යුතුය. යෝජිත පනතට අනුව ත්‍රෛනිකායික මහානායක මාහිමිපාණන් වහන්සේලාගෙන් යුක්ත උසස් උපදේශන කමිටුවක් වන අතර, තුන්නිකාය ම නියෝජනය කෙරෙන ධර්මවිනයධර භික්ෂූන් වහන්සේලාගෙන් හා විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ විෂය පිළිබඳ ප්‍රවීණතාවෙන් යුතු ආචාර්ය භික්ෂූන් වහන්සේලාගෙන් යුක්ත ථෙරවාද ත්‍රිපිටක සංරක්ෂණ මණ්ඩලයක් පත් කෙරේ.

මෙම මණ්ඩලය විසින් බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී ථෙරවාද සම්ප්‍රදයට අනුව කටයුතු කිරීමට බැඳී සිටී. එබැවින් ත්‍රිපිටකය විකෘති කිරීමක් පිළිබඳ කිසියම් පැමිණිල්ලක් විමර්ශනය කිරීමේ දී ථෙරවාද සම්ප්‍රදයට අනුව එය විනිශ්චය කිරීමට මණ්ඩලයට සිදු වේ. මෙම මණ්ඩලය ධර්මවිනයානුකූල පදනමෙහි පිහිටා කටයුතු කිරීමට බැඳී සිටින බැවින් ද මහානායක මාහිමිපාණන් වහන්සේලාගේ උපදේශකත්වය ඇති බැවින් ද වගකිව යුතු නාහිමිපාණන් වහන්සේලා හා උගත්, බුද්ධිමත් භික්ෂූන්ගෙන් යුක්ත වන බැවින් ද මෙම මණ්ඩලයෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විමතියක් ඇතිකරගතයුතු නොවේ.

යෝජිත ත්‍රිපිටක සංරක්ෂණ පනතට අනුව මෙම මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කෙරෙන අතර, මෙම තනතුර පිළිබඳව ද විමතිය මතු කොට තිබේ. මෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා තෝරා ගැනීම සිදු වන්නේ ද මණ්ඩලය විසින්වන අතර, ඔහු මණ්ඩලය පවරණ කාර්ය ඉටු කිරීමට බැඳී සිටී. සාමාන්‍ය පරිපාලන ව්‍යුහයක පවතින බලතල ඔහුට පැවරෙන අතර, එවැනි බලතල පිළිබඳ සඳහන් වගන්ති උපුටා දක්වමින්ඇතැමුන් ඔහු "සර්ව බලධාරී" අයෙකු වනබවට ව්‍යාජ ප්‍රචාර දියත් කරන බව පෙනේ. සාමාන්‍යයෙන් මෙවැනි පනතක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ බලතල සඳහන් කෙරෙන ආකාරය ගැන සුළු හෝ අවබෝධයක් ඇති අය නම් මෙවැනි අසත්‍ය ප්‍රචාරවලින් රැවටිය නොහැකි බව කිව යුතුය.

තවද මෙම පනතෙහි මණ්ඩලයේ බලතල පිළිබඳ සඳහන් වී ඇති වගන්ති පිළිබඳව ද ව්‍යාජ අදහස් සමාජගත කරමින් පවතින බව පෙනෙන්නට තිබේ. "චංචල හෝ නිශ්චල දේපළ මිලදී ගැනීම, දැරීම, බද්දට ගැනීම, විකිණීම" ආදි කරුණු පිළිබඳ දැක්වෙන වගන්තිය ද දේශීය හෝ විදේශීය තැනැත්තන් හෝ ආයතන සමග ගිවිසුම්වල